# DEMAND, SUPPLY, ELASTICITY AND MARKET EQUILIBRIUM

# (Part-II)

***S. Madushanka***

***B.Sc (Mgt) Accounting (Special) (U.G)***

***University of of Sri Jayewardenepura***

## ඉල්ලුම් ප්‍රමාණය වෙනස් වීම

සලකා බලන භාණ්ඩයේ මිල හැර අනෙකුත් සාධක නොවෙනස් ව තිබියදී සලකා බලන භාණ්ඩයේ මිල අඩු හෝ වැඩි වීමකට ප්‍රතිචාරි ව එහි ඉල්ලුම් ප්‍රමාණය වැඩි හෝ අඩු වීම ඉල්ලුම් ප්‍රමාණය වෙනස් වීම ලෙස හඳුන්වයි.

## ඉල්ලුම් සංකෝචනය

අනෙකුත් සාධක ස්ථාවර ව තිබියදී සලකා බලන භාණ්ඩයේ මිල වැඩි වුවහොත් එහි ඉල්ලුම් ප්‍රමාණය අඩු වන අතර එහි බලපෑම නිසා ඉල්ලුම් වක්‍රය මත පිහිටි ලක්ෂ්‍යය ඉහළට ගමන් කරයි.

මෙම සිදුවීම් ඉල්ලුම් සංකෝචනය ලෙස හඳුන්වයි.

## ඉල්ලුම් ප්‍රසාරණය

අනෙකුත් සාධක ස්ථාවරව තිබිය දී සලකා බලන භාණ්ඩයේ මිල අඩු වුවහොත් එහි ඉල්ලුම් ප්‍රමාණය වැඩි වන අතර එහි බලපෑම නිසා ඉල්ලුම් වක්‍රය මත පිහිටි ලක්ෂ්‍යය දිගේ පහළට ගමන් කරයි.

මෙම සිදුවීම ඉල්ලුම් ප්‍රසාරණය ලෙස හඳුන්වයි.

ClassWork.LK

## ඉල්ලුම වෙනස් වීම

සලකා බලන භාණ්ඩයේ මිල ස්ථාවර ව තිබියදී ඉල්ලුම කෙරෙහි බලපාන අනෙකුත් සාධකයක් වෙනස් වීම කරණ කොටගෙන පැවති මිල යටතේ ම ඉල්ලුම ඉහළ යාම හෝ පහළ යාම හෝ ඉල්ලුම වෙනස් වීම ලෙස හඳුන්වයි.

## ඉල්ලුම වැඩි වීම


සලකා බලන භාණ්ඩයේ මිල ස්ථාවර ව තිබිය දී ඉල්ලුම කෙරෙහි බලපාන අනෙකුත් සාධකයක් වෙනස් වීම නිසා පැවති මිල යටතේ ම ඉල්ලුම ඉහළ ගොස් ඉල්ලුම් වක්‍රය දකුණු පසට විතැන් වීම ඉල්ලුම වැඩි වීම ලෙස හඳුන්වයි.

## ඉල්ලුම අඩු වීම

සලකා බලන භාණ්ඩයේ මිල ස්ථාවර ව තිබිය දී ඉල්ලුම කෙරෙහි බලපාන අනෙකුත් සාධකයක් වෙනස් වීම නිසා පැවැති මිල යටතේ ම ඉල්ලුම පහළ ගොස් ඉල්ලුම් වක්‍රය වම් පසට විතැන් වීම ඉල්ලුම අඩු වීම ලෙස හඳුන්වයි.

ClassWork.LK

# භාණ්ඩයක ඉල්ලුම් ප්‍රමාණය වෙනස් වීම හා ඉල්ලුම වෙනස් වීම අතර වෙනස රූප සටහන් ඇසුරින්




## ඉල්ලුම් ප්‍රමාණය වෙනස් වීම නිසා

ඉල්ලුම් ලක්ෂ්‍යය ඉල්ලුම් වක්‍රය දිගේ ඉහළට හෝ පහළට ගමන් කරයි.

## ඉල්ලුම වෙනස් වීම නිසා

ඉල්ලුම් වක්‍රය වමට හෝ දකුණට හෝ විතැන් වේ.

ClassWork.LK

## ඉල්ලුම් වක්‍රය දකුණට විතැන් වීම ට බලපාන හේතු

ආදේශන භාණ්ඩවල මිල වැඩි වීම

අනුපූරක භාණ්ඩවල මිල අඩු වීම

පාරිභෝගික ආදායම වැඩි වීම

පාරිභෝගික රුචිය වැඩි වීම

අනාගතයේ දී මිල වැඩි වෙතැයි අපේක්ෂා කිරීම

ගැනුම්කරුවන් සංඛ්‍යාව වැඩි වීම

## ඉල්ලුම් වක්‍රය වමට විතැන් වීමට බලපාන හේතු

ආදේශන භාණ්ඩවල මිල අඩු වීම

අනුපූරක භාණ්ඩවල මිල වැඩි වීම

පාරිභෝගික ආදායම අඩු වීම
පාරිභෝගික රුචිය අඩු වීම

අනාගතයේ දී මිල අඩු වෙතැයි අපේක්ෂා කිරීම

ගැනුම්කරුවන් සංඛ්‍යාව අඩු වීම

ClassWork LK

2021
2022
2023

# උසස් පෙළ

ගිණුම්කරණය
ආර්ථික විද්‍යාව
ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

# සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

## තනි හෝ කණ්ඩායම් පන්ති
## (English & Sinhala Medium)

# 0763655550

S. Madushanka
B.Sc (Mgt) Accounting (Special) (U.G)
University of of Sri Jayewardenepura